කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

**කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.**

**දෙවන වාර පරීක්ෂණය 2019, මාර්තු** **13 ශ්‍රේණිය**

| ව්‍යාපාර අධ්‍යයනය II | 32 | S | II | පැය තුනයි |
|---|---|---|---|---|

සැලකිය යුතුය :- ♦ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

01. i. අ. ''භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදුවීම'' ව්‍යාපාරයක දැකිය හැකි ගති ලක්ෂණයකි. එයට අමතරව ව්‍යාපාරයක දැකිය හැකි ගති ලක්ෂණ 02 ක් නම් කර කෙටියෙන් පහදන්න. (ලකුණු 2)

ආ. ''ව්‍යාපාර දශක ගණනාවක් තුල පරිවර්තනය වෙමින් විද්‍යුත් ව්‍යාපාර දක්වා විකාශනය වී ඇත.''

1. අද දක්වා ව්‍යාපාර සංවර්ධනයේ මූලික අදියර අනුපිළිවෙලින් පෙළ ගස්වන්න.
2. විද්‍යුත් ව්‍යාපාර (e-Business) යනු කුමක් ද?

ii. ''නිෂ්පාදිතය යනු අවශ්‍යතාවයකට ඇති විසඳුමකි.'' පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය , බෙදාහැරීම , අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු ව්‍යාපාර වේ.

අ. හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කෙරෙන ආකාරය ගැලීම් සටහනක් මඟින් දක්වන්න. (ලකුණු 2)

ආ. ඇපයෙන් සීමිත සමාගමක් සීමිත පොදු සමාගමකින් වෙනස් වන ආකාර 2 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

iv. වර්තමානයේ ව්‍යාපාර සංයෝජනය වී කටයුතු කිරීම ව්‍යාපාර ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ප්‍රවණතාවයකි. එසේ ව්‍යාපාර සංයෝජනය විය හැකි ආකාර සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුව මෙරට තුල ස්ථාපිත කළ හැකි මූලික සමාගම් වර්ග 3 නම් කර සමාගමක නිත්‍ය සන්තතික හැකියාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

02. I. තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දෙමින් වෙළඳපල ජයගත් ව්‍යාපාරිකයෙකුගේ ප්‍රකාශයන් නම් ''තම ව්‍යාපාරයේ සාර්ථකත්වයට සැපයුම්කරුවන්ගේ යහපත් ක්‍රියා පිටුවහලක් වූ බවයි.''

අ. ඉහත ප්‍රකාශයේ දක්වා ඇති සැපයුම්කරුවන් කුමන පරිසර බලවේගයකට අයත් ද? එම ව්‍යාපාරයේ සාර්ථකත්වයට සැපයුම් කරුවන් කෙසේ ඉවහල් වුයේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

ආ. පහත සඳහන් වන්නේ රටේ පවතින්නා වූත් ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන්නා වූත් තොරතුරු සමූහයකි. ඒවා කුමන පරිසර බලවේගවලට අයත් දැයි තීරණය කරන්න.

a. ව්‍යවසායකයින් සඳහා රජය ලබාදෙන ''එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා'' ණය සඳහා අඩුපොලි අනුපාතිකයක් නියම කිරීම.

b. පළාත් සභා මැතිවරණය සඳහා කාන්තා නියෝජනය වැඩි කෙරේ.

c. සේනා දළඹුවාගෙන් බඩඉරිඟු වගාවට හානි

d. ඉරිදා දහම් පාසල් අනිවාර්ය කිරීමට ද එදින පැවැත්වෙන උපකාරක පංති තහනම් කිරීමට ද රජය තීරණය කරයි. (ලකුණු 2)

ii. අ. තිරසර සංවර්ධනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි අර්ථ දක්වන්න. (ලකුණු 2)

ආ. තිරසර සංවර්ධනය උදෙසා වර්තමාන ව්‍යාපාරිකයින් පරිසරය පිළිබඳ දැඩි අවධානයකින් කටයුතු කළ යුතුයි. මේ සඳහා ව්‍යාපාරිකයන් කටයුතු කළ යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

iii. අ. පරිසරයට අවිධිමත් ආකාරයට අපද්‍රව්‍ය මුදාහැරීම මඟින් ශ්‍රී ලංකාව උග්‍ර පාරිසරික ගැටළුවකට මුහුණ දෙමින් සිටී. මෙම ගැටළුවෙන් මිදීම සඳහා 4R සංකල්පයෙන් ඔබට දිය හැකි උපදෙස් විස්තර කරන්න. (ලකුණු 2)

ආ. වර්තමාන ව්‍යාපාරිකයා දැඩි තරඟකාරිත්වයකට හසු වී ඇති බැවින් ව්‍යාපාරික අරමුණු ඉටු කර ගැනීමේ දී පාරිභෝගිකයන්ට සමාජ සංස්කෘතියට , පරිසරයට අහිතකර බලපෑම් එල්ල වේ. එය තිරසර සංවර්ධනයට අහිතකර ලෙස බලපානු ලබයි.
එසේ අහිතකර ලෙස බලපානු ලබන ව්‍යාපාරික කටයුතු 2 ක් නම් කරන්න. (ලකුණු 2)

iv. අ. ව්‍යාපාර ආචාර ධර්ම යන්න අර්ථ දක්වා ව්‍යාපාරවලට ආචාර ධර්ම පද්ධතියක් සැකසීමේ වැදගත්කම කරුණු 4 ක් මගින් දක්වන්න. (ලකුණු 2)

ආ. ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක 4 ක් දක්වන්න. (ලකුණු 2)

v. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවලට රජයේ බලපෑම මධ්‍යම රජය , පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහා සිදුවේ.

අ. මධ්‍යම රජය , පළාත් සභා හා පළාත් පාලන ආයතන පාසල කෙරෙහි මැදිහත් වන ආකාරය නිදසුන් මගින් දක්වන්න. (ලකුණු 2)

ආ. රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මගපෙන්වීම වැදගත් වන ආකාර 4 ක් දක්වන්න. (ලකුණු 2)

03. i. අ. මුදලකින් ඉටු කරන කාර්යයන් සඳහන් කර එම එක් එක් කාර්යය සඳහා නිදසුන බැගින් දක්වන්න. (ලකුණු 2)

ආ. සංස්ථාපිත සමාගමක කොටස් මිල දී ගැනීමට ආයෝජකයෙක් වූ නිමල් අපේක්ෂාවෙන් සිටී. ඔහුගේ මිතුරකු වූ තිලන්ත විසින් ඒ සඳහා කොටස් තැරව්කාර සමාගමකට සම්බන්ධ වන ලෙස දන්වා සිටියහ. කොටස් තැරැව්කාර සමාගමක් යනු කුමක්දැයි පැහැදිලි කර එහි කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. අ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යන තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS) ව්‍යාපාර කටයුතු වල සාර්ථකත්වය සඳහා ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2)

ආ. වාණිජ බැංකු විසින් සපයන ප්‍රධාන සේවා දෙකට අමතරව අනෙකුත් සේවා ව්‍යාපාර වල ක්‍රියාකාරිත්වය කෙරෙහි දැඩි ලෙස බලපෑම් ඇති කරයි. එවැනි අනෙකුත් සේවාවන් 04 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

iii. අ. ''මුහුදු මාර්ග ප්‍රවාහනයේ දී නැවට හා නැව් බඩු වලට සිදු විය හැකි හානි සමුද්‍රිය රක්ෂණය ලබා ගැනීම තුලින් ආවරණය වේ.''
නැව් බඩු රක්ෂණය හා නැව් කඳ රක්ෂණය යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග දෙක බැගින් වෙන් කර ලියා දක්වන්න. (ලකුණු 2)

ආ. නිරාශා තම සැමියාට හා දරුවන් දෙදෙනාට ජීවිත රක්ෂණවරණයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් වෙත යොමු විය. නමුත් එහි දී ඔවුන් නිරාශා හට පවසා සිටියේ ඇයට තම ස්වාමි පුරුෂයාව රක්ෂණය කළ හැකි මුත් ඇයගේ දරුවන් දෙදෙනාගේ ජීවිත රක්ෂණය කළ නොහැකි බවයි.
නිරාශාට තම දරුවන් වෙනුවෙන් ලබා ගත හැකි රක්ෂණ විසඳුමක් පවති ද අදහස් දක්වන්න. (ලකුණු 2)

iv. අ. සඵලදායි සන්නිවේදනයක් සිදු නොවීමට බලපාන බාධාවන් කිහිපයකි. එසේ ඇති වන බාධාවක් හතරක් දක්වන්න. (ලකුණු 2)

ආ. සමාජයීය කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් සේවාවක් ඉටු කරයි. එසේ ඉටු කරන සේවාවන් කවරේදැයි සඳහන් කරන්න. (ලකුණු 2)

v. අ. විද්‍යුත් මුදලින් ගනුදෙනු පියවීමේ දී පාර්ශවකරුවන් කීපදෙනෙකු ඒ සඳහා සම්බන්ධවේ. එම පාර්ශවයන් කවුරුන් ද? (ලකුණු 2)

ආ. වර්තමානයේ ණයපත් මගින් ගනුදෙනු කිරීමේ දී ව්‍යාපාරිකයාට වාසි මෙන්ම අවාසි ද ඇති වේ. එසේ ඇති වන වාසි හා අවාසි කවරේදැයි දක්වන්න. (ලකුණු 2)

04. i. අ. ප්‍රවාහනය වෙළඳාමේ ව්‍යාප්තියටත් පුද්ගලයින්ගේ පැතිරීමටත් විශාල වශයෙන් හේතු වී ඇත. මේ අනුව ප්‍රවාහනය ව්‍යාපාරිකයින්ටත් පුද්ගලයන්ටත් ආර්ථිකයටත් වැදගත් වන ආකාර වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 2)

ආ. ශ්‍රී ලංකාවේ රථවාහන භාවිතය ඉහළ යාමේ ප්‍රවණතාවයක් දැකිය හැකිය. එම වාතාවරණය තුල උද්ගත වී ඇති ගැටලු කවරේ ද? (ලකුණු 2)

ii. අ. ගබඩාවක් ස්ථානගත කිරීමේ දී ව්‍යාපාරිකයෙකු විසින් අවධානය යොමු කල යුතු කරුණු කිහිපයක් ඇත. එවැනි කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

ආ. ආයතනවල ස්වරූපය අනුව නිෂ්පාදිත වල ස්වරූපය අනුව විවිධ ආකාරයේ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති ක්‍රියාත්මක වේ. එවැනි පද්ධති හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

iii. අ. සිල්ලර වෙළඳාම වර්තමානයේ නව ප්‍රවණතා කිපයකින් ඉදිරියට පැමිණ පාරභෝගිකයන්ට වඩා හොඳ සේවාවක් සපයනු ලබයි. (ලකුණු 2)
එසේ සිල්ලර වෙළඳාම තුලින් දැකිය හැකි නව ප්‍රවණතා මොනවා දැයි සඳහන් කරන්න.

ආ. විදේශ වෙළඳාම සඳහා පදනම් වී ඇති සාධක කිපයකි. එවැනි සාධක 04 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

iv. කුළු බඩු අපනයනය කරන ආයතනයක් ගම්මිරිස් තොගයක් අපනයන කිරීමට බලාපොරොත්තුවේ ඒ සඳහා එම ආයතනය අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය අනුපිළිවෙලින් විස්තර කරන්න. (ලකුණු 2)

v. වෙළඳ සංගම් වෙළඳ ගිවිසුම් හා ජත්‍යන්තර සංවිධාන විදේශ වෙළඳාම කෙරෙහි විවිධ වූ බලපෑම් ඇති කරයි. එවැනි බලපෑම ඇති කරන ආකාරයන් මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 2)

## II කොටස

05. වෙනස් වෙමින් පවත්නා පරිසරයක් තුළ **ව්‍යාපාරික සම්පත් කාර්යක්‍ෂමතාවයෙන්** යුතුව යොදා ගනිමින් ආයතනික පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා අන් අය ලවා කාර්ය කිරීමත් කළමනාකරණය වේ.

i. ඉහත නිර්වචනයට අදාලව පහත පද හඳුන්වන්න.
අ. ව්‍යාපාරික සම්පත් ආ. කාර්යක්‍ෂමතාව (ලකුණු 4)

ii. කාර්යක්‍ෂමතාවය හා සඵලදායකත්වය අතර ඇති සම්බන්ධතාවය දක්වන්න. (ලකුණු 4)

iii. ''විවිධ පුද්ගල කණ්ඩායම් සමඟ කටයුතු කිරීමේ දී **යහපත් පුද්ගල සබඳතා** තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි.'' ඒ අනුව කළමනාකරුවෙකු ප්‍රගුණ කළ යුතු ඉහත කුසලතා වර්ගය හඳුන්වා එහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. ව්‍යාපාරයක් විසින් කර්මාන්තයක් ස්ථානගත කිරීමේ දී අපේක්ෂා කරන සමාජ ප්‍රතිලාභ මොනවා ද? (ලකුණු 4)

v. ''පර්යේෂණ හා සංවර්ධන වියදම්වල ප්‍රතිලාභ දිගු කාලයේ දී හිමි වේ.'' පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවක කාර්ය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

06. ''සී/ස සපුමල් සමාගම'' A හා B යනුවෙන් නිෂ්පාදන අංශ දෙකකින් සමන්විත වන අතර පිළිවෙළින් සේවකයෝ 100 දෙනෙක් හා 50 දෙනෙක් සේවයේ නිරත වී සිටිති. ලබන වසරේ දී අංශ දෙකේම නිෂ්පාදිත ප්‍රමාණය 50% වැඩි කිරීමට බලාපොරොත්තු වන අතර ඒ අනුව සේවක සංඛ්‍යාව ද වැඩි කිරීමට අපේක්ෂිතය. ඒ අනුව A අංශයේ සේවකයන් දෙදෙනෙකු විශ්‍රාම යාමට ද අපේක්ෂිතය 50% ක් සේවකයන් පිටතින් බඳවා ගැනීමට ද අපේක්ෂා කෙරේ.

i. සි/ෂ සපුමල් සමාගමේ ඉදිරි වර්ෂය සඳහා මානව සම්පත් අවශ්‍යතා පුරෝකථන වගුවක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 4)

ii. ව්‍යාපාරයක මානව සම්පතක සෙසු සම්පත් වලට සාපේක්ෂව දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ 4 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

iii. රැකියා විස්තරය හා රැකියා පිරිවිතර අතර වෙනස්කම් 4 ක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. ඇසුරුමක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණක් ලෙස තාක්ෂණික යෝග්‍යතාව වැදගත් වන ආකාරය උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. අලෙවිකරණය ගනුදෙනුකරුගෙන් ආරම්භ වී ගනුදෙනුකරුගෙන්ම අවසන් වන ක්‍රියාවක් බව පැහැදිලි වේ. නූතන අලෙවිකරන චින්තනයේ හරයන් 2 ක් නම් කර කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 4)

07. I. මූල්‍ය කළමනාකරණය ව්‍යාපාරයක කළමණාකරනයේ වැදගත්කම සංධිස්ථානයක් වේ. මූල්‍ය කළමනාකරනයේ පරමාර්ථ නම් කර කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 4)

ii. ව්‍යාපාරයකට අවශ්‍ය මූල්‍ය ප්‍රමාණ තීරණය කිරීමේ දී සලකා බලන සාධක 4 ක් ලියන්න. ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. සී/ස සමාගමකට අදාල තොරතුරු පහත වේ.

| | |
|---|---|
| 2018. 01. 01 බඩු තොගය | 300 000 |
| 2018 වර්ෂයේ විකුණුම් | 1 250 000 |
| 2018 වර්ෂයේ ගැනුම් | 1 150 000 |
| ආපසු යැවුම් | 250 000 |
| 2018. 12. 31 බඩු තොගය | 200 000 |

අ. තොග පිරිවැටුම් අනුපාතය හා දළ ලාභය අනුපාතය ගණනය කරන්න.

ආ. තොග පිරිවැටුම් අනුපාතය හා ජංගම අනුපාතය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. දේශිය ඇගළුම් නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන කටයුතු පුළුවල් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. එබැවින් නව නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව සැලසුම් කිරීමට ඔබට භාර වී ඇත. එහි දී ඔබ විසින් සැලකිල්ලට ගන්නා කරුණු මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

v. අ. වර්තමානයේ සේවක කාර්ය ඵල ඇගැයීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වෙමින් පවතී. කාර්යඵල ඇගැයීමකින් ආයතනයට හා සේවකයින්ට අත්වන වාසි 2 බැගින් වෙන වෙනම දක්වන්න. (ලකුණු 2)

ආ. ව්‍යාපාර විසින් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් ලෙස සේවක පිරිවැටම හඳුනාගත හැකිය. මෙම සේවක පිරිවැටුම වැඩි වීමට බලපෑ හැකි කරුණු 4 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

08. I. පසුගිය වාර විභාගයේ දී ව්‍යාපාර අධ්‍යයන විෂයට සිසුන් කිහිප දෙනෙක් ලබා ගත් ලකුණු ගුරුතුමිය පන්තියේ දී ප්‍රදර්ශනය කරන ලදී. ලකුණු හතලිහට අඩු සිසුන් පහක් සිටින බව ගුරුතුමිය ප්‍රකාශ කලාය.

අ. දත්ත හා තොරතුරු අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ආ. දත්ත ක්‍රම කීපයකින් ඉදිරිපත් කළ හැකිය. දත්ත ඉදිරිපත් කළ හැකි ආකාර දෙකක් උදාහරණ සහිතව සඳහන් කරන්න. (ලකුණු 2)

ii. අ. වර්තමානයේ පාරිභෝගිකයින් තම එදිනෙදා කටයුතු සඳහා අන්තර්ජාල පහසුකම් ලබා ගනියි. එසේ පාරිභෝගිකයින්ට ලබා ගත හැකි සේවා පහසුකම් 4 ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 2)

ආ. අතීතයේ ව්‍යාපාර කටයුතු අත්හුරු ක්‍රමයට සිදු කළ ද වර්තමානයේ පරිගණක තාක්ෂණය බහුල වශයෙන් භාවිතා කරනු දක්නය ලැබේ. එසේ සිදු කරනු ලබන ව්‍යාපර කටයුතු 4 ක් නම් කර ඒවාට උදාහරණ දෙක බැගින් දක්වන්න. (ලකුණු 2)

iii. අ. ව්‍යාපාර විස්තරය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි විස්තර කර එහි ඇතුළත් කරන තොරතුරු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ආ. ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී ගනුදෙණු සැකසුම් පද්ධතියක් (TPS) භාවිතා කිරීම තුළින් කළමනාකරුවන්ට ලැබෙන ප්‍රයෝජන දක්වන්න. (ලකුණු 2)

iv. අ. මූල්‍ය සැලැස්මක ඇතුළත් කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 2)

ආ. ව්‍යාපාර සැලැස්මක් පිළියෙළ කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 4 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

v. අ. විධායක සාරාංශය ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2)

ආ. නව ව්‍යාපාර අවස්ථාව වෙනුවෙන් පමණක් නොව ව්‍යාපාරය සම්බන්ධ විවිධ අවස්ථාවල දී ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කළ හැකි බවට උදාහරණ 02 ක් සඳහන් කරන්න. (ලකුණු 2)